**හෙළ වෙද වතගොත**

වියපත් රෝගීන් සුවපත් කරවන බැලවානේ වෙද පරම්පරාවේ වතගොත



# බැලවාන මහ වෙදැදුරු පැරකුම් සේනානායක අංශභාග රෝගයෙන් පීඩා විඳින රෝගීන් සුවපත් කරවන ආකාරය

වසර 2500 කටත් එහා ගිය අපේ පාරම්පරික වෙදකම, පසුකාලීනව ආයුර්වේදයෙන් ඔපවත් වූ අපේ දේශීය වෙදකම බොහෝ රෝගාබාධ විෂයෙහි අද දවසේද පාන විකුම් අප මවිත කරවන සුළුය. වෙසෙසින්ම අධි තාක්ෂණයෙන්, නව්‍ය දැණුමෙන් සන්නද්ධ ජනප්‍රිය බටහිර වෙදකමටද කළ නොහැකි හාස්කම් අපේ පාරම්පරික වෙදැදුරන් අතින් සිදු වෙයි. දේශ දීපංකරයේ ප්‍රතිකාර වලින් සුවපත් කළ නොහැකි රෝගීන් ඈත පිටිසර ගමේ ''වෙදමහත්තයා'' අතින් සුවපත් වන අවස්ථා විරල නොවේ. එවන් වූ අමිල ගුණ සම්භාරයක් ඇති දේශීය වෙදකම නොනැසී රැකගන්නා හෙළ වෙද සෘෂිවරුන්ගේ වතගොත හඳුන්වා දීමේ නවතම විශේෂාංගයක් මේ කලාපයත් සමගින් ඇරඹීමට වෛද්‍යවරයා අපේක්ෂා කරයි.

එහි ප්‍රාරම්භය වශයෙන් අංශභාග රෝගීන් සුවපත් කිරීමෙහිලා සුපතල නමක් දිනූ වෛද්‍යවරයෙක් මෙවර ඔබට හඳුන්වා දෙමු.

### මාටින් සේනානායක වෙද උරුමය

අවිස්සාවේල්ල, බැලවානේ වෙදගෙදර නොහොත් සිරිවෙද මැදුර ගැන මේ රටේ ජනතාව කතා කරන්නට යොමු වූයේ මීට වසර හැට හැත්තෑවකට පෙර සිටමය. ඉන්දියාවේ කල්කටාවෙන් ආයුර්වේද අධ්‍යාපනය ලබා වෙදකම ආරම්භ කළ මාර්ටින් නෝනිස් සේනානායක වෙදැදුරාණන්ගේ හපන්කම් මේ රටේ ජනතාව මුලින්ම හඳුනාගත්තේ 1940 දශකයේදීය. විශේෂයෙන්ම අංශභාග රෝගීන් සුවපත් කිරීමෙහිලා අතිශය සමත්කම් දැක්වූ මාටින් සේනානායක වෙදැදුරා සියළු සර්වාංග රෝග සුවපත් කිරීමෙහිලා ද මහත් සමතෙකු විය. බැලවාන ශ්‍රේෂ්ඨ වෙද පරපුරකට උරුම කී සීතාවක ප්‍රදේශයේ පිංබර ගම්මානයක් ලෙස ගෞරවාදරයට පාත්‍ර වූයේ එතැන් සිටය.

මාටින් නෝනිස් සේනානායක වෙද උරුමය මතු පරපුර වෙත ගෙන යාමට ඉදිරිපත් වූ පැරකුම් සේනානායක වෙදැදුරානන් බැලවාන වෙද පරම්පරාවේ අද දවසේ නියෝජනයයි. අංශභාග රෝගීන් මෙන්ම හන්දිපත් අසනීපකම් සහිත රෝගීන් සුවපත් කිරීමෙහිලා පැරකුම් සේනානායක වෛද්‍යවරයානන් දක්වන පරිචය අද මේ රටේ ජනතාවගේ මහත් ගෞරවාදරයට පාත්‍ර වී තිබේ.



### පියතුමන් ගිය මග තෝරාගත් ගුණවත් පුතු

ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේදයෙන් අධ්‍යාපනික ප්‍රවේශයත් තම පියාගෙන් උරුම වූ වෛද්‍යමය භාවිතාවත් ඇසුරේ එතුමන් අතින් අද දවසේ විශාල රෝගීන් සංඛ්‍යාවක් සුවපත් වන්නේය. එතුමන් මූලික ආයුර්වේද අධ්‍යාපනය ලැබූයේ 1980-85 කාලයේ ගම්පහ වික්‍රමාරච්චි වෛද්‍ය විද්‍යාලයෙනි. එම වෛද්‍ය ශිෂ්‍ය කණ්ඩායමේ වැඩිම ලකුණු ලබාගත් වෛද්‍ය ශිෂ්‍යයා වීම නිසා මෙතුමන්ට එහිම කථිකාචාර්ය පදවියක් පිරිනැමුනත් ඔහුගේ අභිප්‍රාය වූයේ තම පියාණන් ගිය මග යමින් උපන් බිමෙහි සිට රෝගීන් හට සරණ වීමයි. මේ තීරණයත් සමගම තම පියතුමන් සෙවණේ පස් වසරක සීමාවාසික පරිච්ඡේදයක් ගත කිරීමට අවස්ථාව සැලසීන. පැරකුම් සේනානායක වෙදැදුරන් මේ වන විට වසර තිහක කාලයක් තිස්සේ රෝගීන්ට ප්‍රතිකාර සලසයි.

### ප්‍රතිකාර කරන රෝග

සෙම් රෝග, පීනස් රෝග, වාත රෝග, ස්නායු රෝග ආදී සර්වාංග රෝග සුවපත් කිරීමෙහිලා ඉමහත් ප්‍රසිද්ධියට පත්ව සිටින වෙදැදුරු පැරකුම් සේනානායක මැතිඳුන් සන්ධි රෝග ප්‍රතිකාර කෙරෙහිද ඉමහත් ප්‍රසිද්ධියට පත්ව තිබේ. දනහිස් ඉදිමීම, දනහිස් වල වතුර, සන්ධි නැවීමේ අපහසුව, කාටිලේජ අඩුවීම වැනි විවිධ සන්ධි රෝග වලට සාර්ථකව ප්‍රතිකාර කරන මෙතුමන් දනහිස් බද්ධ කිරීමට අවශ්‍ය යයි තීන්දු කරන ලද බරපතල සන්ධි ආබාධ සහිත රෝගීන් විශාල සංඛ්‍යාවකට ඖෂධීය ප්‍රතිකාර මගින් සම්පූර්ණ සුවය ලබා දී තිබේ.

### සන්ධිගත රෝග සුවපත් කිරීමෙහිලා ඇති පරිචය

සන්ධිගත රෝග සුවපත් කිරීමෙහිලා ඇති පරිචය මෙන්ම පැරකුම් සේනානායක වෙදැදුරුතුමන් පතල කීර්තිය ලබා ඇත්තේ අංශභාග රෝගීන් සුවපත් කිරීම වෙනුවෙනි. අංශභාගය මොළයට වන රුධිර සැපයුම අවහිර වීම නිසා මොළයේ ඒ ආශ්‍රිත සෛල විනාශ වීමෙන් ඇතිවන බරපතල රෝගයකි. මොළයේ සෛල යනු ශරීරයේ වෙනත් සෛල මෙන් විනාශ වූ කල්හී අළුතෙන් හැදෙන ඒවා නොවේ. ශරීරයේ සෑම කෘත්‍යයකටම සමානුයෝජන ක්‍රියාවලිය සිදු කරන්නේ මොළයෙනි. මේ අනුව අංශභාගය ඇති වූ කල්හී මොළයට වන හානියට අනුරූප ක්‍රියාව අකර්මණ්‍ය වෙයි. වම් අත පන නැති වන්නේ වම් අතෙහි ක්‍රියාවලිය සමානුයෝජනය කරන මොළයේ ස්ථානය අක්‍රීය වීමෙනි. කතාවට බලපාන මොළයේ ප්‍රදේශයේ රුධිරවහනයක් ඇති වුණොත් කතාව ගොත ගැහෙයි. නැතහොත් කතාව නැති වෙයි.



## අංශභාග රෝගීන්ට කරන බැලවානේ පාරම්පරික ප්‍රතිකාර

මේ අංශභාග රෝගියාගේ ස්වභාවයයි. බටහිර වෙදකමේදී අංශභාග රෝගියෙකුට දෙන ප්‍රතිකාර ඇතැම් විට සාර්ථක වන්නට පුළුවන. අසාර්ථක වන අවස්ථාවේදී බොහෝ දෙනෙක් දේශීය වෙදකමට යොමු වන්නේ මේ අංශභාග රෝගීන් සඳහා බටහිර වෙදකමට වැඩි යමක් ආයුර්වේදයෙන් කළ හැකිය යන මතයක් අපේ සමාජයේම මුල් බැස ඇති නිසාය.

බැලවාන වෙදකම අංශභාගයට බොහෝම ප්‍රචලිතයි. අංශභාග රෝගය සම්බන්ධයෙන් ඔබතුමන් රෝගීන්ට දෙන පණිවිඩය කුමක්ද ? අප පැරකුම් සේනානායක වෙදැදුරානන් විචාලෙමු.

---

### වෙදැදුරු අවදිකළ හඬ

''අංශභාගය සංකීර්ණ රෝගයක්. මේකෙදි රෝගියා ඉතා අසරණ භාවයට පත් වෙනවා. මේ හොඳට වැඩපළ කරගෙන තවත් අයටත් උදව් පදව් කරගෙන හිටිය රෝගියාට අතක් පයක් හොලවන්න බැරි වෙන්න පුළුවන්. කතා කරගන්න බැරි වෙන්න පුළුවන්. නැගිටගන්න බැරිව උන්හිටි තැන මළ මූත්‍රා පහ වෙන්න පුළුවන්. ඒ තරමටම අංශභාග රෝගීන් අසරණ වෙනවා.''

''මේ රෝගීන් සුවපත් කිරීම අප සෑහෙන කාලයක සිට සිදු කරනවා. අපේ විශේෂ ප්‍රතිකාර ක්‍රමයෙන් සති හයක් යන විට දැනෙන වෙනසක් ඇති වෙනවා. එහෙම කියන්නෙ ප්‍රතිකාර කරන වෛද්‍යවරයා වන මම නොවෙයි. එය රෝගියාටම තේරෙන්න ඕනි. රෝගියාගෙ ඥාතීන්ටත් තේරෙනවා. එහෙම අනිත් අයට දැනෙන වෙනසක් ලබා දෙන්නට අප ප්‍රතිකාර කරනවා. ඒක සහතිකයක්. යම් හෙයකින් එහෙම නොවෙනවා නම් ආයෙ ඒ රෝගියාට බෙහෙත් නොකළට කමක් නෑ... එහෙම කියන්නෙ රෝගියා අත් හරිනවා කියන එක නොවෙයි. ඒ අපේ පරම්පරාවෙ වෙදකම එතරම්ම විශ්වාසනීයයි. හැබැයි මේකෙ අරුත සති හයෙන් රෝගියා සම්පූර්ණයෙන්ම සුවපත් කරනව කියන එක නොවෙයි. එය තමයි ආරම්භය. දැනෙන වෙනස... එතැන් පටන් ඒ ඒ රෝගියාගේ ස්වභාවය අනූව කලක් ප්‍රතිකාර ගන්න වෙනවා. මේ ආකාරයෙන් ප්‍රතිකාර ගන්න රෝගීන් නිසැකයෙන්ම සුවය ලබනවා.'' පැරකුම් සේනානායක වෙදැදුරානන් අපට පැවසීය.

මේ රෝගය ඇති වෙන්නට පෙරාතුව ඇති වෙන රෝග ලක්ෂණ ගැන විමසීමේදී පැරකුම් සේනානායක වෙදැදුරුතුමන් පහත ලක්ෂණ තිබුණොත් ඒ සම්බන්ධයෙන් සැළකිළිමත් විය යුතු යයි පවසන ලදී.

### අංශභාගය ඇතිවීමට පෙර ඇතිවිය හැකි රෝග ලක්ෂණ කිහිපයක්

- රුධිර පීඩනය වැඩිවීම
- හිසරදය
- ක්ලාන්තය
- ආබාධය ඇතිවන පැත්තේ ඇතිවන මස්පිඬු  නලියන ගතිය - වේදනාව
- හිරිය
- ශරීරය පැත්තකට ඇදී යන ආකාරයක් දැනීම

''අංශභාගය දේශීය ප්‍රතිකාර වලින් සුවපත් කළ හැකියි. ඒ සඳහා කිසියම් කාලයක් ගත වුණාත් ඉවසීමෙන් නියම පිළිවෙලට ප්‍රතිකාර ගැනීමේදී රෝගය සුවය ලැබීමේ අනගි අවස්ථාවක් තිබෙනවා.'' වෛද්‍ය පැරකුම් සේනානායක වෙදැදුරුතුමන් පවසන්නේය.

### අංශභාගය රෝගීන්ට දෙන ප්‍රතිකාර විධි මොනවාද ?

මෙයට පිළිතුරු දුන් පැරකුම් සේනානායක වෙදැදුරුතුමන් පැවසූයේ ප්‍රතිකාර පංතියක්ම ඒ සඳහා තිබෙන බවයි. බොන ඖෂධ, දිවේ තියන රස ඖෂධ, තෙල් බෙහෙත්, පැළැස්තර වගේම රෝගියාගේ පෝෂණයට ගැලපෙන හිතකර ආහාර වර්ග ලබාදීමත් මෙහිදී වැදගත් වෙනවා.

### අංශභාග රෝගීනට ව්‍යායාමය ඉතා වැදගත්

ඒ හැරෙන්නට ව්‍යායාමත් වැදගත්. මංතීරු වල ඇවිදීම... දිවීම... මේ වගේ ව්‍යායාම කරන්න රෝගියාට බැහැනෙ. රෝගියෙකුට කරන ව්‍යායාම බොහෝම ඉවසීමෙන් කළ යුතුයි. ඇවිදින්න බැරිව එක තැන ඉන්න රෝගියෙකුට නම් ආධාරකයක්, ඔය උණ ලීයක් හරහට බැඳල හරි ඒක අල්ලගෙන බිත්තිය අල්ලගෙන හරි ඇවිදින්න උදව් කරන්න ඕනි.  ඇතැම් රෝගීන්ට බත් කන එක, ඇඟිලි වලට ව්‍යායාමයක් ලෙස කමීසයට බොත්තම් දාන එකත් හොඳ ව්‍යායාමයක්. සමහර රෝගීන්ට අපි ගැඹුරු වතුර භාජනයක් පත්තකින් කලතන්න දෙනව. මතුපිටක තියෙන කාසි ඇහිඳින එක ඇඟිලි අකර්මන්‍ය වුණ අයට හොඳ ව්‍යායාමයක්. ශරීරයේ සවිඥාණික ක්‍රියාකාරකම් වලදී මොළයත් සම්බන්ධ වෙනවා. මේ මොළය සම්බන්ධ කරගෙන සිද්ධ වෙන කවර කාර්යයක් වුණත් රෝගියාට ව්‍යායාමයක ගුණ දෙනවා.



### අංශභාග රෝගීන් හට තෙල් ගැල්වීම

අංශභාග රෝගීන්ට ගල්වන තෙල් වර්ග රාශියක් තිබෙනවා. හිසට ගල්වනවා. අත්පා වල තෙල් ගල්වනවා. පැලැස්තර ආදියත් දානවා. තෙල් ගැල්වීමේදී නිවැරදි ක්‍රමයක් තියෙනවා තෙල් ගල්වන සමේ කූප වලින් තමයි තෙල් උරා ගන්නේ . ඒ සඳහා පහළ සිට ඉහළටයි අත ගෑ යුත්තේ. එවිටයි තෙල් ටික හරියට උරාගන්නේ.

මේ ලබා දෙන බෙහෙත් සමට උරාගත්තම ඒවා ශරීරයට ගිහින් එහි ඖෂධීය ගුණාංග ක්‍රියාත්මක වෙනවා. එයින් තමයි සහනය ලැබෙන්නේ.

### බෙහෙත් පැලැස්තර සත්කාරය

බෙහෙත් පැලැස්තර දැමීමත් අංශභාග රෝගීන්ට කරන විශේෂ ප්‍රතිකාරයක්. කොන්ද දිගට දාන බෙහෙත් පැලැස්තරයෙන් සුෂුම්නාවට තෙල් උරා ගන්නවා. රුධිර පීඩනය වැඩි අයට කුප්පමේනිය එළඟි තෙලෙන් අඹරපු තෙල් පැලැස්තරයක් දානවා. යටි පතුලටත් නිල උත්තේජනය කරන්න මේ විදිහට පැලැස්තරයක් දාන්න පුළුවනි. කිරි පැලැස්තරය දාන්නෙ ස්නායු පෝෂකයක් විදිහට. මේ නිසා ස්නායු උත්තේජනය වීමක් සිද්ධ වෙනවා. අකර්මන්‍ය වුණු ස්නායු යථා තත්ත්වයට පත් කරවන්න මෙය රුකුලක් වෙනවා. ඔබ දැකල ඇති සමහර රෝගීන්ගෙ මාංශපේශි ක්ෂය වෙනවා. ශරීරය බලා ඉද්දි වැහැරෙනවා. ඒව ශක්තිමත් කිරීමට කිරි පැලැස්තරය උපකාරී වෙනවා. උඳුපිටි, හීන් අමුක්කරා පිටි, එළකිරි දාල කකාරල අත් වල, කකුල් වල ගෑමෙන් මේ රෝගීනට අපමණ සුවයක් ලැබෙනවා.

### අංශභාග රෝගීන්ගේ පෝෂණය

අංශභාග රෝගීන්ට උෂ්ණ ආහාර අගුණයි. ලුණුවිල, ගොටුකොළ, මොනර කුඩුමබිය වගේ ආහාර තමයි දෙන්න ඕනි. මෙයින් ලුණුවිල විශේෂයි. එයින් මේ රෝගීන්ට විශාල ගුණයක් ලැබෙනවා. පැරැන්නො ලුණුවිල බොහෝම කැමැත්තෙන් ආහාරයට ගත්ත. කුසියෙ කළගෙඩි තිබුණු තැන තෙතමනයට ලුණුවිල කුමසියෙම හැදෙනවා. ඒව ආහාරයට ගන්න පහසුයිනෙ.

### ඇල් වතුර අගුණයි

අංශභාග රෝගීන්ට වතුර තරමක් අගුණයි. නානව නම් බෙහෙත් කොළ තම්බපු උණු වතුර තමයි සුදුසු.

බැලවානේ වෙද මහත්තය මේ රෝගීන්ට සති හයක විශේෂ බෙහෙත් පංතියක් දෙනව. හරියට උපස්ථාන කළොත්, වෙලාවට බෙහෙත් ටික දුන්නොත් ගුණ දෙනව. ඒ ගැන සැකයක් නෑ. උපදෙස් අනුව රෝගියාට ඒ ඖෂධ ලබා දීමයි කළ යුත්තෙ. මුලින් කිව්ව වගේ සති හයෙන් ලෙඩේ කඩා ගන්න බෑ. ඒත් දැනෙන වෙනසක් ඇති වෙනවා. ඉන් පසුව දෙන බේත්හේත් වලින් කාලයක් යන විට රෝගියාට සුවය ළඟා කරගන්න පුළුවනි.

### උසස් තත්ත්වයේ ආයුර්වේද ඖෂධ "පද්ම ශ්‍රී රං ඔසු" සන්නාමයෙන්

බැලවාන වෙද මහත්මයාගේ අංශභාග රෝගීන් සඳහා වන ඖෂධද ඇතුළුව සියළුම ඖෂධ නිෂ්පාදනය කරන්නේද ඔහුගේ පෞද්ගලික අධීක්ෂණය යටතේය. ඔසු ආනුපාන වල ඇති බලගතු ගුණය සුරැකෙන සේ ඉමහත් පරිශ්‍රමයකින් උපරිම ගුණ දෙන මේ වෙද පරම්පරාවේ ඔසු ලබාදෙන්නේ ''පද්ම ශ්‍රී රං ඔසු'' යන නාමයෙනි.

### බැලවාන සිරි වෙද මැදුරට යන පාර

අවිස්සාවේල්ලෙන් තල්දූව හන්දියට කිලෝමීටරයයි. එතැන් සිට අම්තිරිගල පාරෙ කිලෝමීටර් තුනක දුරක් ගියාම සේනානායක වෙදමහත්මයාගේ වෙද අරණ හමු වෙනවා.

### ප්‍රතිකාර ගන්නට යන්න පෙර දිනය වෙන් කරවා ගන්න

ප්‍රතිකාර ගන්නට පෙර දුරකථනයෙන් වෙලාවක් වෙන් කරවා ගත යුතුයි. අඟහරුවදා, සිකුරාදා සහ පසළොස්වක පෝය දිනවල ප්‍රතිකාර කරන්නේ නෑ. අනෙකුත් දිනවල උදේ 8 සිට දවල් 12 දක්වාත්, දවල් 2 සිට රාත්‍රී හත දක්වාත් ප්‍රතිකාර කරනවා.

වැඩිදුර විස්තර දැනගන්න දුරකථන අංක පහත දැක්වෙනවා.
0362230011
0718393252